# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

හිදැල්ලන, රත්නපුර

# වාර්ෂික වාර්තාව 2012

GJRTI

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

## හා

## අභ්‍යාස ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2012

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා
අභ්‍යාස ආයතනය
හිදැල්ලන
රත්නපුර
2013.09.29

ගරු පරිසර අමාත්‍යතුමා,
පරිසර අමාත්‍යංශය,
සම්පත්පාය,
නො 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.


ගරු අමාත්‍යතුමනි,

# <u>වාර්ෂික වාර්තාව 2012</u>

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2012 වර්ෂය සඳහා වු මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තාව.
2. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු ආයතනයේ ආදායම් හා වියදම් වාර්තාව, 2012 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුදල් ප්‍රවාහ ප්‍රකාශය
3. 2012 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී,



..................
ෆයිසාල් රශීන්
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය



# දැක්ම

"මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම."

# මෙහෙවර

"මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි"

## 2. අධ්‍යක්‍ෂ මණ්ඩල සංයුතිය

### 2.1 2012 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 01 | ෆයිසාල් රශීන් මහතා (සභාපති) | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති (2008.07.15 දින සිට 2012.12.21 දක්වා) |
| 02 | ඉන්ද්‍රජිත් අපෝන්සු මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (2010.05.14 දින සිට 2012.08.06 දක්වා) |
| 03 | මහාචාර්ය එන්.පී. විජයානන්ද මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (2008.04.23 දින සිට 2012.12.21 දක්වා) |
| 04 | ඩබ්.එච්.එම් නිමල් බණ්ඩාර මහතා | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (2012.04.26 දින සිට 2012.12.21 දක්වා) |
| 05 | ඒ.ඩී.ඒ.කේ නන්දසේන මිය | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත) (2011.09.29 දින සිට 2013.12.30 දක්වා) |

### 2.2 ඉහළ කළමණාකාරිත්වය

තිලක් ධර්මරත්න මහතා ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්

( B.Sc, M.Sc in Gemmology (SL), M.Sc (UK) (2000.08.01 – අද දක්වා)

## 3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

### 3.1 අවස්ථා

- **පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම**

  ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ. මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතිම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ගද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත. මෙම ක්ෂේත්‍රයට අදාල සම්පූර්ණ පරාසය තුල පුහුණු සේවාවන් ලබා දෙන වෙනත් කිසිදු ආයතනයක් නොමැත. එසේම මෙම කර්මාන්තයට අවශ්‍ය පර්යේෂණ අවශ්‍යතා සපුරාගෙන සේවා සපයන්නෙකු ද කලාපය තුල නොමැත. එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගනිමින් තිබෙන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොල අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත.

- **සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

  ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත. මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේෂණ, ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම, ප්‍රාථමික මැණික් නිධි ලබා ගැනීමේ තාක්ෂණය සැලසුම් කිරීම හා සැකසීම, සහ පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ සහ නිෂ්පාදනය වෙනුවෙන් පුහුණුව ලබාදීමද ඇතුලත් වේ.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත.

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබාදීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ විශ්ව විද්‍යාලයක් මට්ටමට මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් සම්පාදනය මගින් ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අසමසම මට්ටමක ආයතනය පවතී.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංධීය වැඩසටහන්**

  පරිසර අධිකාරීන් සමග ඒකාබද්ධව කර්මාන්තයේදී යොදා ගත හැකි මැණික් පරිසර හිතකාමී පතල් කැනීම් ක්‍රම සඳහා අනුබල දීම සඳහා ද, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහාද, වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහාද සහසම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත.

- **ප්‍රචාරක වැඩසටහන්**

  ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කල යුතුව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, මැණික් හා ස්වර්ණාභරණ සඟරා සහ පුවත් පත්‍රිකා, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය යොදාගත හැක.

## 3.2 <u>අභියෝග</u>

- **යටිතල පහසුකම්**

  පුහුණු ඒකක වල ප්‍රමාණවත්ව නවීන පහසුකම් හා යන්ත්‍රෝපකරණ සංවර්ධනය වී නොමැත. එවැනි උපකරණ මෙම පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුවල දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතු වේ. ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍රෝපකරණ හඳුන්වා දිය යුතු වේ. තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත. දියමන්ති කැපීම මෙම ක්ෂේත්‍රයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබාදීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගතයුතු වේ. තවද විදුලි උදුන් භාවිතයෙන් මැණික් වල වර්ණ වැඩි දියුණු කිරීමේ නව ක්‍රම වේදයන් හඳුන්වා දීමේ හැකියාව මෙම ආයතනය සතුව පැවතියද එම තාක්ෂණික උපකරණ හිඟය මේ සඳහා අහිතකර ලෙස බලපා ඇත.

- **භෞතික සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන හා උපකරණ වල හිඟකමක් දක්නට ඇත. තවද වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද ආයතනය සතුව නොපවතී.

- **සේවකයන්ගේ දුර්වල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයන් සෘණාත්මක ආකල්පමය මානසික පසුබිමක සිටීම.

- **සහෝදර ආයතන මගින් අපගේ සේවාවන්ම සිදුකිරීම**

  උදාහරණ:- අපගේ පුහුණු, රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**

  කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සකස් කරන ලද ආයතනයේ නව සේවක සැලැස්මෙහි ඇති ආයතනයට අවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු සිදුකරනු ලැබිණි.

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම සහ මෙම මෙම ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිතව සිටින නිලධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමුකිරීමට ඇති අවස්ථාවන් අවම වීම හේතුවෙන් අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් නොවන බව පෙනියයි. එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාක් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසඳුම් ලබා ගත හැකි වේ.

  ආයතනයේ පරිපාලන කටයුතු සිදු කිරීමේදී රත්නපුරයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිතව තිබීම ගැටළුවක්ව පැවතුණි. මේ සඳහා පියවරක් ලෙස ප්‍රධාන කාර්යාලය කොළඹ ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට පියවර ගත යුතු වේ.

- **මුල්‍ය සම්පත්**
  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් දායකත්වයක් මහාභාණ්ඩාගාරය වෙතින් නොලැබේ. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් ආයතනයේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීම වෙනුවෙන් අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී නොමැත.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම -**
  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම -**
  උදාහරණ:- සේවා කැපුම් අංශය

- **භූ විද්‍යාඥයන්ගේ හා පුහුණු විශේෂඥයන්ගේ හිඟකම**

- **පර්යේෂකයන්ට සහ පුහුණු කරුවන්ට උසස් පුහුණු කටයුතු සඳහා අවස්ථාවන් නොමැති කම සහ අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ, පුහුණු සහ අනෙකුත් ආධාරක කාර්යය මණ්ඩලය අතර සේවක පරතරයක් පැවතීම**

## 4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

### 4.1 අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව 1995 ජුලි 28 දිනැති හා අංක 882 ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබීය. ආයතනයේ ප්‍රධාන අරමුණු වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

### 4.2 ආයතනයේ බලතල

1995 ජුලි 28 දිනැති අංක 882 දරණ ගැසට් පත්‍රය මගින් ආයතනයට පවරා ඇති බලතල පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ හා එම නිධි පිලිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම

   i ඒවායේ පිහිටීම

   ii මැණික් ඛනිජ නිධි හඳුනා ගැනීම

   iii මැණික් ගල් අනර්ගිකරණය කරන ක්‍රම

   iv ආයතනයට සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර වල කටයුතු

(ii) පතල් කැපීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ මැණික් පිරියම් ක්‍රම යන අංශ වලට අදාලව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලු තාක්ෂණික හා අනෙකුත් උපදෙස් ලබාදීම.

(iii) පහත සඳහන් අංශයන්හි පුහුණුව ලබා දීම.

i මැණික් කැපීම

ii ස්වර්ණාභරණ නිෂ්පාදනය

iii දියමන්ති ඇතුලු රත්න විද්‍යාව

iv ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය

v මැණික් ගල් අනර්ගීකරණය හා ගෙවුඩ තාපකරණය ඇතුලුව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත වලට සම්බන්ධ අනෙකුත් අංශ

## 4.3 ක්‍රියාකාරකම් හා කාර්යක්‍ෂමතාවය

4.3.1 පුහුණු පාඨමාලා දිවයිනේ ප්‍රචලිත කිරීම සඳහා පියවර ගෙන තිබූ අතර තරුණ තරුණියන් අඛණ්ඩව පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත.

**අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ කාර්යයන්.**

## 4.4 පුහුණු අංශයේ 2012 වර්ෂයේ ප්‍රගතිය

පසුගිය වර්ෂයේදී ආයතනය මගින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉල්ලුමක් සහිත පාඨමාලා රැසක් මෙහෙයවීමට පියවර ගනු ලැබිණි. මේ මගින් කර්මාන්තයේ නියැළෙන පුහුණු ශිල්පීන් බොහෝමයකට උසස් තාක්ෂණික හා කර්මාන්තය ආශ්‍රිත ශිල්පීය දැනුම ලබා දීමට කටයුතු කරනු ලැබිණි. සහජ කුසලතා වලින් පිරිපුන් මෙම පුහුණු ලාභීන් ආයතනය මගින් ලබා ගත් අධ්‍යාපනික දැනුම මත දේශීය හා ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරගකාරී ව්‍යාපාරයක් ලෙස මෙහෙයවීමට සමත් වනු ඇත.

1. 2012 වර්ෂයේ පුහුණු මධ්‍යස්ථාන 06 ක මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට සම්බන්ධ පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ලැබිණි. රත්නපුර, කොළඹ, මහනුවර, ගාල්ල, බුත්තල, බිංගිරිය යන මධ්‍යස්ථානයන්හි කාර්යක්ෂමව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පුහුණු ඉල්ලුම ප්‍රාදේශීය වශයෙන් සැපිරීමට පියවර ගනු ලැබිණි.
2. කුසලතා වලින් පිරිපුන් අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට යොමු කර ඔවුන් ස්වයං රැකියා ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමට සබරගමුව පළාත් සභාවල ජාතික යොවුන් සේනාංකය, කැනඩා ලෝක විශ්ව විද්‍යාල සේවය යන බාහිර ආයතන වල අනුග්‍රහය ලබා ගැනීමට කටයුතු කරනු ලැබිණි.
3. 2012 ජාතික පරිසර දින වැඩසටහනට සමගාමීව බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ පුහුණු ඒකකයක් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව මෙම වර්ෂයේ ආරම්භ කරනු ලබැනි. මේ මගින් මෙම ප්‍රදේශය තුල මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට නූතන තාක්ෂණික දැනුම ලබා දීමේ අවකාශය සලස්වා ගනු ලැබිණි.
4. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීමට තෘතිය හා වෘත්තිය පුහුණු දෙපාර්තමේන්තුව වෙතින් පූර්ණ අවසරය ලබා ගත් අතර මැණික් කැපීම සහ ඔප දැමීම පාඨමාලාව NVQ 4 මට්ටමට සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබිණි.

5. 2012 වර්ෂයේ ප්‍රධාන වැඩමුළු / ප්‍රදර්ශණ වැඩසටහන් 10 ක් සඳහා ආයතනය සෘජුවම දායක විය. මේ අනුව නවක නිර්මාණශිලි පුහුණු ලාභින් ක්ෂේත්‍රයට හඳුනා ගැනිමට හා කර්මාන්තය ව්‍යාප්ත කිරිමට තාක්ෂණය හා දැනුම සඳහා ප්‍රජාව දැනුවත් කිරිමට හැකි විය.

6. විලාසිතා ආභරණ සඳහා දේශිය වෙළඳ පොළ දිනෙන් දින පුළුල් වන බව හඳුනා ගත හැකිවේග ඒ අනුව විලාසිතා ආභරණ නිෂ්පාදන ඒකකය දේශීයව ස්ථාපනයට දැනුම, තාක්ෂණය හා කුසලතාවය ලබා දිම සඳහා එම පුහුණු පාඨමාලා ආයතනය මගින් හඳුන්වා දිමට පියවර ගනු ලැබිණි.

7. පුහුණු ඒකකය සඳහා නව තාක්ෂණික මෙවලම් හඳුන්වා දීමට මුලික කටයුතු රාශියක් සිදු කරනු ලැබිණි. ඒ අනුව එම තාක්ෂණික භාවිතයන් 2013 වර්ෂයේ පුහුණු ඒකක සඳහා හඳුන්වා දිමට හැකි වේ.

8. 2012 වර්ෂය තුල ශිෂ්‍ය ලියාපදිංචිය හා පාඨමාලා සම්පුර්ණ කිරිම

8.1 ශිෂ්‍ය ලියාපදිංචිය

| **පාඨමාලාව** | **ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|
| රත්න විද්‍යාව | 103 |
| ගෙවුඩ තාප පිරියම් කිරිම | 51 |
| මැණික් කැපිම සහ ඔප දැම්ම | 83 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරිම හා අලෙවිකරණය | 89 |
| ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | 34 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 39 |
| විලාසිතා ආභරණ නිෂ්පාදනය | 24 |
| ආභරණ සඳහා ගල් බැඳිම | 09 |
| **එකතුව** | **432** |

9. 2012 වර්ෂය තුලදී අවසන් කරන ලද පුහුණු පාඨමාල සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ. 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද පුහුණු පාඨමාලා සමහරක් 2013 වර්ෂයේදී අවසාන විමට නියමිතය.

| **පාඨමාලාව** | **පාඨමාලාව අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|
| රත්න විද්‍යාව | 30 |
| ගෙවුඩ තාප පිරියම් කිරිම | 51 |
| මැණික් කැපිම සහ ඔප දැම්ම | 61 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරිම හා අලෙවිකරණය | 48 |
| ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | 16 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 37 |
| විලාසිතා ආභරණ නිෂ්පාදනය | - |
| ආභරණ සඳහා ගල් බැඳිම | - |
| **එකතුව** | **243** |

2012 වර්ෂය තුලදී ක්‍රියාවට නංවන කටයුතු සඳහා අවශ්‍ය මුලික කාර්යයන් රැසක් අතිරේක වශයෙන් ආවරණය කරනු ලැබිණි. එනම් පාඨමාලා නවිකරණය , නව තාක්ෂණය හඳුන්වාදිම, දේශිය අමුද්‍රව්‍ය භාවිතා කල හැකි හා නව නිර්මාණකරණයට අවශ්‍ය පාඨමාලා හඳුන්වා දිම හා පුහුණු පාඨමාලා ප්‍රතිනනය කිරිමේ කටයුතු ඒ අතර ප්‍රධාන වේ.

## 4.5 මානව සම්පත් සංවර්ධනය

| | නම | තනතුර | වැඩමුළුව/ පාඨමාලාව | ආයතනය |
|---|---|---|---|---|
| 01<br>02<br>03<br>04 | ධම්මි රූපසිංහ මිය<br>ඩබ්.ජේ.පී සෙනෙවිරත්න මිය<br>අසෝක රාජරත්න මයා<br>නයනා ලක්ෂිකා මිය | කළමණාකාර සහකාර | Reading and Under standing Financial Statment | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය |
| 05<br>06<br>07<br>08<br>09 | පී. ප්‍රේමදාස මයා<br>මෛත්‍රී පුෂ්පකුමාර මයා<br>පුබුදු නිශාන්ත මයා<br>අබේසිංහ මයා<br>පී. හසංග ලක්ෂාන් මයා | රියදුරු | Office Procedure | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය |
| 10<br>11<br>12<br>13<br>14 | පී. තුඹලියද්ද මයා<br>එච්. රසික අසංක මයා<br>කේ.ජේ.පී ජයනාත් මයා<br>එස්.කේ පෙරේරා මයා<br>එච් පතිරණ මෙනෙවිය | ක්ෂේත්‍ර හා කාර්යාල සහායක | Office Procedure | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය |
| 15 | ඩබ්.ජේ.පී සෙනෙවිරත්න මිය | කළමණාකාර සහකාර | Diploma in Software Engineering | සබරගමුව විශ්ව විද්‍යාලය |
| 16 | ධම්මි රූපසිංහ මිය | කළමණාකාර සහකාර | Diploma in Computer Accounting | ඊ සොෆ්ට් ආයතනය |


**2012 පර්යේෂණ ව්‍යාපෘති**

**ව්‍යාපෘතිය(1) ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණ හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ ඛණිජ ද්‍රව්‍ය වලින් ලැබෙන වාර්ෂික සමස්ත විදේශ ආදායමෙන් 80% ක් ම ලැබෙනුයේ මැණික් මගිනි. ශ්‍රී ලංකාවේ මුළු භූමියෙන් 50% ක පමණකම මැණික් විභවයක් පවතින බව නවතම විද්‍යාත්මක පර්යේෂණ මගින් හඳුනාගෙන ඇත. නමුත් මෙම මැණික් තැන්පතු සහ විභවයන් හඳුනාගැනීමත්, ස්වභාවික පරිසරයට අවම හානියක් වන ක්‍රමවේදයන් හරහා කැණීම් සිදුකිරීමත් මැණික් කර්මාන්තයට ඇති ප්‍රධාන අභියෝගයන් වේ.

"මහින්ද චින්තන නව ශ්‍රී ලංකාවක් කරා" දස අවුරුදු දැක්ම අනුව මෙම අභියෝගයට පිළියමක් ලෙස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයෙන් තිරසාර උපයෝජනයක් වෙනුවෙන් මැණික් නිධි හඳුනාගැනීමට, විභවය ඇගයීමට සහ ලැයිස්තුගත කිරීමට ශ්‍රී ලංකාවේ ක්‍රමවත් මැණික් නිධි ගවේෂණ වැඩසටහනක් යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පුරා මැණික් විභව සිතියම් නිර්මාණය කිරීම මගින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින කොටස් කරුවන්ගේ දියුණුව සැලසීම හරහා රටේ තිරසාර සංවර්ධනයයි. 2008 වර්ෂයේදී මේ සඳහා විස්තරාත්මක යෝජනාවක් කැබිනට් මණ්ඩලය වෙත ලබාදුන් අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය හා අරමුදල් ලැබී ඇත.ඒ අනුව 2010 වර්ෂයේදී ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර රූප සටහන 01 ට අනුව එය මේ වන විට ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මකව පවතී.

මේ වන විට ක්ෂේත්‍ර ගවේෂණ, රසායනාගාර විශ්ලේෂණ, භූ තොරතුරු විද්‍යා තාක්ෂණ කටයුතු, දත්ත විශ්ලේෂණය හා තක්සේරු කිරීම් , මැණික් විභව සිතියම නිර්මාණය කිරීමත් සිදු කොට ඇත. (රූප සටහන් 02 සහ 03). බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ ප්‍රාථමික මැණික් විභව සිතියම 2012 වර්ෂයේ අවසන්කොට ඇත (රූප සටහන 04). දැනට මෙම ව්‍යාපෘතිය මොණරාගල දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨශ තුල සිදුකෙරෙමින් පවතී.





රූප සටහන 01 - අධ්‍යයන ප්‍රදේශය






රූප සටහන 02 - පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර ගවේෂණ සිදුකිරීම



රූප සටහන් 03 - නියැදි රසායනාගාර පර්යේෂණ සඳහා සකස්කිරීම





රූප සටහන් 04 - බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ මූලික මැණික් විභව සිතියම


**ව්‍යාපෘතිය 2) ශ්‍රී ලංකාවේ රත්රං නිධි ගවේෂණ හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වූයේ කළු ගඟ, වලවේ ගඟ, කැළණි ගඟ පෝෂක ප්‍රදේහවල (රූප සටහන 05) පිහිටි රත්රං නිධි පිහිටීම සහ රත්තං නිධි ආශ්‍රිත ඛණිජ විද්‍යාත්මක හා භූ රසායන විද්‍යාත්මක ලක්‍ෂණ අධ්‍යයනය තුලින් ඒවා ඇති වීමට හෙතුවූ ඛණිජ විද්‍යාත්මක ලක්‍ෂණ යාන්ත්‍රණය අධ්‍යයනයත් සහ ආර්ථිකමය වටිනාකම තීරණය කිරීමත්ය.


ක්ෂේත්‍ර සමීක්‍ෂණ, නියැදි එකතුකිරීම් සහ රසායනාගාර පරීක්‍ෂණ සිදුකර ඇත (රූප සටහන් 06) .
ලැබුණු නිරීක්‍ෂන (රූප සටහන 07) අනුව මෙම රත්රං නිධි ස්ථානීය නිධි ලෙස ගංගාවල් වල දියළු ප්‍රදේශ වල පවතින බව නිගමනය කෙරිණි.




රූප සටහන 05 - අධ්‍යයන ගංගා පෝෂක ප්‍රදේශය



රූප සටහන් 06 - පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර ගවේෂණ සිදුකිරීම




රූප සටහන් 07 - රසායනාගාර විශ්ලේෂණය මගින් හඳුනාගත් රත්රං නියැදි

**ව්‍යාපෘතිය 3) තිරසාර සංවර්ධනයක් සඳහා පරිසර හිතකාමී පතල් කැණීම් ක්‍රම හඳුනාගැනීමේ ව්‍යාපෘතිය**

මැණික් පතල් කැපීම හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පරිසරිකව හා සමාජීයව බලපෑම් ඇතිකරයි. මෙම බලපෑම කළමණාකරණය කිරීම කර්මාන්තය තුල ඇති විශාල අභියෝගයකි. පරිසර හිතකාමී පතල් කැනීම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයන් තුලින් එම අභියෝගයන්ට මුහුණ දීම සඳහා මැණික් කර්මාන්තයේ වත්මන් උත්සහයක් ඇත.

**"මහින්ද චින්තන ඉදිරි දැක්ම"** අනුව මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අදාල ප්‍රදේශ වල ස්වාභාවික තත්ව, දේශගුණය, භූ රූපණ විද්‍යාව, පස ආදී පාරිසරික සංවේදීතාවයන් සැලකිල්ලට ගෙන පරිසර හිතකාමී මැණික් පතල් ක්‍රම හඳුන්වා දීමයි. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේදී වර්තමාන මැණික් කැණීමේ ක්‍රමවේදයන්, නීති රීති හා විවිධ භූ විද්‍යාත්මක තත්ව වලට අදාල විවිධ පරිසර හිතකාමී පතල් කැණීම් ක්‍රමවේදයන් පෙලගස්වන ලදී.

වර්තමාන කැණීම් ක්‍රමවේදයන් සහ නීති රීති අධ්‍යයනය කොට වර්තමාන කැණීමේ තත්වයන් හා අවට පරිසර තත්ත්වයන් දැනගැනීමට අවශ්‍ය ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු සිදුකරන ලදී (රූප සටහන 08). ඒ අනුව පරිසර හිතකාමී මැණික් පතල් කැණීම් ක්‍රමවේදයන් හඳුනාගෙන ඇත.








රූප සටහන 08- නිරීක්ෂණය කරන ලද වර්තමාන මැණික් පතල් කැණීම් ක්‍රියාකාරකම්

## 4) ප්‍රකාශන

“Ground Instability caused by Gem Mining Activities Practiced in Sri Lanka” නමින් පර්යේෂණ ප්‍රකාශනයක් 2012 පෙබරවාරි 24 දින පැවති ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමයේ වාර්ෂික තාක්ෂණික සැසියේදී ප්‍රකාශයට පත් කරන ලදී (රූප සටහන 09).



*Proceedings of the 28th Annual Sessions*
*Geological Society of Sri Lanka*
*24th Feb. 2012 Colombo, Sri Lanka*

**Ground Instability Caused by Gem Mining Activities Practiced in Sri Lanka**

**W.A.K.C. Wickramaarachchi[1], R.M.N.P.K. Jayasinghe[1], H.M.R. Premasiri[2] and Tilak Dharmaratne[1]**

[1]Gem and Jewelry Research and Training Institute (GJRTI), Hidellana, Ratnapura.
[2]Department of Earth Resources Engineering, University of Moratuwa, Moratuwa.
(email: tilakdharma@yahoo.com)

**ABSTRACT**

Common gem mining practices in Sri Lanka, such as, shallow mining, deep mining, tunnel mining, river dredging, open cast mining and mechanical mining has a severe impact on structures due to surface subsidence and mass/ground movement. Attempts were made to study these ground movements and related environmental issues in Ratnapura area as a sample study. It was noted that ground movement may occur principally due to two reasons, (a) ground instability (b) changing state of the ground stress.

Open cast mining using heavy machinery causes short term and long term ground movements in response to ground loss during excavation arising from the changes in the state of ground stress as load is transferred from the ground. This horizontal displacement of the support wall at depth results ground movement affecting the constructions at the upper slopes. On the other hand, during dewatering (the lowering of the water table) and sucking for mechanized gravel washing from the mine in alluvial beds, high water-pressure gradients close to the pump can draw finer grains out of the soil. The resulting soil structure is susceptible to collapse-settlements. Further, when ground-water is pumped from pore spaces between grains of sand and gravel, the lowered water pressure in the sand and gravel layers causes slow drainage of water from the clay and silt in gem beds. The reduced water pressure in clay and silt beds change their geotechnical properties and those become more compact, and its effects are seen as land subsidence and cracking in the ground. These changes are often not reversed and remain as permanent damages causing collapsing and cracking in the walls of permanent structures situated around the mines. Underground tunnels and adits sometimes exceed the limits of the mines, with their walls and shafts supported using rubber timber, ferns and areca-nut trees. Gravity and the weight of overlaying strata cause failure of weakly supported walls of abandoned tunnel and adits and incompletely refilled mine shafts often cause ground subsidence.

Therefore, mitigating measures to reduce ground movement using appropriate mining methods, implementing suitable engineering measures and introduction of methods for evaluating the potential impacts to structures have to be introduced. Further, it is important to maintain a database on old, abandoned and currently operating mines to reduce effects on future constructions.

- 2 -

රූප සටහන 09 - 2012 පෙබරවාරි 24 දින පැවති ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමයේ වාර්ෂික තාක්ෂණික සැසි ප්‍රකාශනයේ ප්‍රකාශිත පර්යේෂණ පත්‍රිකාව

**5) තාප පිරියම් කිරීම මගින් හා ගැමා විකිරණ පිරියම් කිරීම මගින් ශ්‍රී ලංකාවේ හමුවන තද ගෙවුඩ වල වර්ණය වැඩිදියුණු කිරීම.**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ හමුවන විවිධ ගෙවුඩ වර්ගයන් සඳහා පිරියම් කිරීමේ ප්‍රශස්ත තත්ත්ව සොයාගැනෙන අතර එමගින් සාර්ථකව තාප පිරියම් කර වර්ණය හා පැහැදිලි බව වැඩිදියුණු කරගත හැක. එමගින් ශ්‍රී ලංකාවේ හමුවන තද ගෙවුඩ සඳහා මෙතෙක් එවැනි තත්ව සොයාගෙන නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතිය මගින් තද ගෙවුඩ සඳහා තාප පිරියම් කිරීමට ප්‍රශස්ත තත්ත්ව සෙවීම එක් අරමුණක් වේ.

තවද, තාප පිරියම් කරන ලද හා ස්වාභාවික නිල් මැණික් වෙන්කර හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් හයිඩ්‍රොක්සිල් බන්ධන පිහිටීම පදනම් කර ගනිමින් සෙවීමද ප්‍රධාන අරමුණක් වේ.

**ප්‍රගතිය**

<u>සාම්පල් එක්රැස් කිරීම හා සැකසීම</u>

තද ගෙවුඩ සාම්පල 36 ක් මිලදී ගත් අතර ඒවා ප්‍රකාශ අක්ෂයට සමාන්තරව තීරු කිහිපයකට ඉරන ලදී.

<u>තාප පිරියම් කිරීම</u>


තෝරා ගන්නා ලද සාම්පල ඔක්සිහාරක හා ඔක්සිකාරක තත්ව යටතේ 1800 $^{0}$C උෂ්ණත්වයට ගෑස් උදුනක් භාවිතයෙන් තාප පිරියම් කරන ලදී. එහිදී ඔක්සිහාරක තත්ව (reducing conditions) යටතේ තාප පිරියම් කරන ලද සාම්පල තද නිල් පැහැය ගැන්වූ අතර ඔක්සිකාරක තත්ව (oxidizing conditions) යටතේ තාප පිරියම් කරන ලද සාම්පල ලා පාටක් ගන්නා ලදී.




රූපය සටහන - 01 : විවිධ තත්ව යටතේ තාප පිරියම් කරන ලද ගෙවුඩ සාම්පල


<u>FTIR විශ්ලේෂණය</u>

තාප පිරියම් කිරීමට පෙර හා පසුව අධෝරක්ත කිරණ (Infrared) අවශෝෂණ වර්ණාවලිය FTIR (Fourier Transfer Infrared) උපකරණ මගින් ලබාගන්නා ලදී. මෙහි ප්‍රතිඵල පැහැදිලිව පෙන්වා දී ඇත්තේ තාප පිරියම් කරන ලද ශ්‍රී ලංකාවේ නිල් මැණික් වල හයිඩ්‍රොක්සිල් (OH) බන්ධන වලට අනුරූප අවශෝෂණයන් 3310$^{o}$C හිදී (රූපසටහන 02 හා 03) ලබාදෙන බවය. මෙය තාප පිරියම් කිරීමට පෙර දැකිය නොහැක. තවද මෙය තාප පිරියම් කරන ලද වායුගෝලීය තත්ව මත රඳා පවතී.




රූපසටහන - 02 :

අධෝරක්ත කිරණ අවශෝෂණ වර්ණාවලිය ඔක්සිහාරක තත්ව යටතේ තාප පිරියම් කිරීමට පෙර හා පසු




රූපසටහන - 03 :

ඔක්සිකාරක තත්ව යටතේ තාප පිරියම් කිරීමට පෙර හා පසු අධෝරක්ත කිරණ අවශෝෂණ වර්ණාවලිය

## විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය

පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන | 20,228 | 25,321 | 25,885 | 27,420 | 29,629 |
| වෙනත් දායක වීම් | 6,289 | 5,330 | 8,322 | 12,500 | 13,853 |
| පාඨමාලා ගාස්තු | 5,597 | 2,614 | 2,397 | 3,256 | 5228 |
| සේවා ගාස්තු ආදායම් | 45 | 22 | 24 | 25 | 30 |
| භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම් | - | - | | | |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **32,159** | **33,286** | **36,628** | **43,201** | **48,740** |
| වෙනත් ආදායම් | | | | 44 | 223 |
| පොලී ආදායම | 151 | 69 | 159 | 166 | 309 |
| වෙනත් ලැබීම් | 404 | 194 | 164 | 205 | 140 |
| **මුළු ආදායම** | **32,714** | **33,750** | **36,952** | **43,616** | **49,412** |
| අඩුකලා - වියදම් | | | | | |
| ඒ) සේවක හා පරිපාලන වියදම් | 29,119 | 26,504 | 28,629 | 30,328 | 35,403 |
| බී) ක්ෂය සහ පොදු වියදම් | 7,570 | 6,402 | 9,102 | 12,905 | 14,217 |
| **මුළු වියදම්** | **36,689** | **32,906** | **37,732** | **43,233** | **49,619** |
| **අතිරික්තය (ඌණතාවය)** | **(3,975)** | **644** | **(779)** | **383** | **(207)** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ**
**2012 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය**

| විස්තරය | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | රු..000 | රු..000 | රු..000 | රු..000 |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර | | 29,628.5 | | 27,419.5 |
| **වෙනත් ආදායම්** | | | | |
| පාඨමාලා ගාස්තු | | 5,227.9 | | 3,255.5 |
| ගෙවුඩ තාපකරණ ගාස්තු | | 30.0 | | 25 |
| භූ විද්‍යා පර්යේෂණ සේවා | | | | |
| පොලී ආදායම් | | 309.7 | | 166.3 |
| විවිධ ආදායම් | | 140.5 | | 205.4 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | **35,336.6** | | **31,071.7** |
| **අඩු කළා : මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්‍ය මණ්ඩල වැටුප් හා දීමනා | | 21,773.4 | | 18,924.1 |
| ගමන් වියදම් | | 447.2 | | 437.5 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | 1,820.3 | | 1,743.6 |
| නඩත්තු වියදම් | | 1,335.7 | | 1,642.0 |
| ගිවිසුම් ගත සේවා | | 7,974.5 | | 6,467.8 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | | 1,308.6 | | 696.5 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 719.8 | | 393.3 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | **35,379.4** | | **30,304.8** |
| **මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)** | | **(42.8)** | | **766.8** |
| අඩු කළා මූල්‍ය පිරිවැය | | (23.4) | | (22.7) |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන | 6,356.1 | | 6,458.6 | |
| වෙනත් ලැබීම් | | | | |
| | 6,356.1 | | 6,458.6 | |
| අඩු කළා ක්ෂය කපා හැරීමේ වියදම් | (6,720.5) | (364.4) | 6,863.9 | (405.3) |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන | 7496.6 | | 6,040.9 | |
| අඩු කළා ප්‍රාග්ධන ආයෝජන වියදම් | (6155.2) | | (5,723.4) | |
| ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම් | (1341.5) | | (317.5) | |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම | | | | |
| මෙහෙයුම් නොවන ආදායම් | | **(387.7)** | | **(428)** |
| **එකතු කලා වත්කම් විකිණීමෙන් ලද ආදායම** | | 223.2 | | 44.2 |
| **අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතාවය)** | | (207.4) | | 383.1 |
| අති විශේෂ අයිතම | | | | |
| **කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | | **(207.4)** | | **383.1** |
| එකතු කලා | (62632.6) | | (62,815.64 ) | |
| පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | | | | |
| අඩු කළා ඊ පෙර වර්ෂ ගැලපීම් | | (62,632.6) | (200.0) | (63,015.7 ) |
| **ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) ඉදිරියට ගෙන ගියා** | | **(62,840.0)** | | **(62,632.6)** |

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ
2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල යන්ත්‍ර උපකරණ | 23,501 | | 26,916 | |
| පාරිතෝෂික අරමුදල | 2,240 | 25,741 | 1,036 | 27,952 |
| | | | | |
| **විලම්භිත වියදම්** | | | | |
| නවීකරණ සහ වෙන් කිරීමේ වියදම් | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 1,268 | | 1,375 | |
| අඩු කළා: ලියා හැරීම් සඳහා වෙන් කිරීම් | (648) | | (648) | |
| | 620 | | 727 | |
| විකිණීම සඳහා ඇති පොත් | 105 | | 146 | |
| ණය හා අත්තිකාරම් | 772 | | 661 | |
| බැංකු තැන්පතු ගිණුම් (කෙටිකාලීන) | 2,024 | | 1,755 | |
| තැන්පතු | 905 | | 880 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 43 | | 47 | |
| පෙර ගෙවීම් | 285 | | 234 | |
| මුදල් හා බැංකු | 3,531 | 8285 | 2,726 | 7,177 |
| **වත්කම් එකතුව** | | 34,026 | | 35,129 |
| | | | | |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 227 | | 230 | |
| උපචිත වියදම් | 3,281 | | 3,419 | |
| ණය හිමියෝ | 119 | | 119 | |
| උපයන විට ගෙවීම් බදු | 19 | 3,647 | 12 | 3,781 |
| | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාලන ගිණුම් (ජා. මැ. ස්. අධිකාරිය) | 3,179 | | 3,179 | |
| ප්‍රදාන-(වෙනත් ආයතන) | 440 | | 162 | |
| පරිතෝෂික සඳහා වෙන්කිරීම් | 8,973 | | 7,641 | |
| සේවක ආරක්ෂක තැන්පතු | 10 | 12,602 | 10 | 10,993 |
| **වගකීම් එකතුව** | | 16,249 | | 14,774 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **17,777** | | **20,355** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | | |
| සහභාගිත්ව ප්‍රාග්ධනය | | 50,000 | | 50,000 |
| සංචිත | | 3,000 | | 3,000 |
| වෙනත් දායක වීම් | | 850 | | 850 |
| සේවක චක්‍රිය අරමුදල | | 797 | | 772 |
| විලම්භිත ආදායම් / ප්‍රාග්ධන ප්‍රතිපාදන | | 25,970 | | 28,365 |
| සමුච්චිත අරමුදල | | (62,840) | | (62,633) |
| | | | | |
| **ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව** | | **17,777** | | **20,355** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රු('000)

| | 2012 | 2011 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත (ඌනතාව) | (431) | (428) |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂය වෙන්කිරීම | 6,721 | 6,864 |
| විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම් | (13,853) | (12,500) |
| ගෙවීම් වැඩිවීම් | (133) | (1123) |
| අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම | 278 | (4166) |
| සේවක පිරිවැය සඳහා ප්‍රතිපාදන වල වැඩි වීම | 1,331 | 417 |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම | (304) | 3727 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | |
| ප්‍රාග්ධන වියදම් කපාහැරීම් | 7497 | 6041 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)** | 1,106 | 1,078 |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | (3305) | (1307) |
| යන්ත්‍ර හා උපකරණ විකිණීම් වලින් ලැබීම් | (1204) | (6041) |
| ආයෝජන විකිණීම් වලින් ලැබීම් | (7497) | 22 |
| යන්ත්‍ර හා උපකරණ විකිණීම් වලින් ලද ලාභ | 25 | 44 |
| වත්කම් විකිණීම් | 223 | 129 |
| **ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)** | (11,758) | (7152) |
| **<u>මුල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය</u>** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 11,457 | 8692 |
| රජයට විශේෂ අය වීම් | | |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)** | 11,457 | 8692 |
| මුදල් හා මුල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ) | 805 | 2,618 |
| ආරම්භක මුදල් /මුල්‍ය ශේෂය | 2,726 | 108 |
| **වර්ෂය අවසානයේ මුදල් / මුල්‍ය ශේෂය** | **3,531** | **2,726** |

මගේ අංකය / எனது இல / My No: එස්පී/ආර්පි එෆ්/පී.ජේ/ආර්.ටී. අයි/අගි 2012/05
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / Date: 2014 ජනවාරි 21 දින.

සභාපති,

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

----------------------------------------------------------------------------------------------------------------------------------

-

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 32 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපතිවරයා වෙත 2013 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


නො. 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි .

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවයේ නියුතුව සිටි ජ්‍යෙෂ්ඨ කළමණාකරුවකු විසින් සිදු කරන ලද රන් රිදී වංචාවේ තව දුරටත් අය විය යුතු රු.648,000 ක තොගය සමාලෝචිත වර්ෂයේ අවසන් තොගයෙන් කපා හැරීමට යෝජිත වෙන් කිරීමක් වශයෙන් අඩු කර දක්වා තිබූ අතර, තව දුරටත් අය කර ගත යුතු තොග ශේෂයක් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි. එම නිලධාරියාට එරෙහිව නීතිමය ක්රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත යොමු කළ බවට ප්‍රකාශ කර තිබුණත්, 2013 ඔක්තෝබර් 31 දින වන විටත් ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පාරිතෝෂික අරමුදල් ඉතිරි කිරීමේ ගිණුමෙන් 2012 අප්‍රේල් 25 දින රු.1,000,000 ක් ලබාගෙන ස්ථාවර තැන්පතුවක් ආරම්භ කර තිබුණ ද, පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුමට හර කර පාරිතෝෂික අරමුදල් ඉතිරි කිරීමේ ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනය නමින් ලියාපදිංචි කර තිබුණු රු.11,700,000 ක් වටිනාකම වූ වාහන 02 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවක පාරිතෝෂික අරමුදලේ 2012 වර්ෂය තුළ දී මුදල් ගලා යෑම රු.1,165,710 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,204,000 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) කැනඩා ලෝක විශ්ව විද්‍යාල ව්‍යාපෘති අරමුදල මඟින් ලබා දෙන සම්පූර්ණ මුදල ආදායම් යටතේ නොපෙන්වා එම මුදලින් පාඨමාලාවට අදාල වියදම් අඩු කර ඉතිරිය වූ රු.350,288 ක් පමණක් පාඨමාලා ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ආදායම් විෂයයන් 3 කට හා වියදම් විෂයකට අදාල එකතුව රු.6,165,408 කට අදාල ගනුදෙනුවල පාඨමාලා උපලේඛනය, ආදායම් මූලාශ්‍ර සහ බිල්පත්‍ර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxxiii පරිච්ඡේදයේ 6 වගන්තියට පටහැනිව ආයතනයේ හිටපු සභාපතිවරයාගේ පෞද්ගලික නමට පවරා තිබූ නඩුවක් වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.219,600 ක් ආයතනයේ අරමුදල්වලින් ගෙවා තිබුණි.

### 2.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ පුහුණු මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත ලබා ගෙන තිබූ ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුව 2012 ජනවාරි 01 දින සිට 2012 ඔක්තෝබර් 05 දින දක්වා කුලී මුදල් වශයෙන් රු.1,350,000 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනය ස්ථාපිත කළ මුල් අවධියේ සිට ආයතනයේ නිලධාරින් සහ සේවකයින් සඳහා විධිමත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ඉතිරි කර ගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම් කර තිබූ අතර, 2011 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් එකතුව රු.860,670 ක් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂවල ඉතිරි කර ගත් නිවාඩු වෙනුවෙන් 2012 වර්ෂයේ ණය හිමියන් යටතේ රු.944,039 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.207,402 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.383,079 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.590,481 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුද්ගල පඩිනඩි රු.2,849,300 කින් ද, ගිවිසුම් ගත සේවා රු.1,506,700 කින් ද, පුහුණු වැඩ සටහන් වියදම් රු.612,100 කින් ද සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.326,500 කින් ද වැඩි වීම පිරිහීම ඇති වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රු.29,628,500 ක රජයේ ප්‍රදාන හා රු.5,227,900 ක පාඨමාලා ආදායම ඇතුළුව මුළු ආදායම රු.35,336,600 ක් වූ අතර, පාඨමාලා ආදායම මුළු ආදායමෙන් සියයට 14.79 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. මෙහෙයුම් කටයුතු සඳහා මුළු වියදම රු.35,379,400 ක් වී තිබුණි. පාඨමාලා ආදායම ඇතුළු අනෙකුත් ආදායම් අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු සඳහා දරන වියදම් ආවරණය කර ගැනීමට එය ප්‍රමාණවත් වී නොතිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි.

--------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව, ආයතනයේ සේවයේ යෙදී සිටි අයෙකු සහ කුලියට ගත් ගොඩනැගිල්ල නියමිත දිනට භාර නොදීම සම්බන්ධව ගොඩනැගිලි හිමිකරුවකු විසින් රු.5,200,000 ක වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව අධිකරණවල නඩු දෙකක් ගොනු කර තිබුණි.

(ආ) ආයතනයේ සේවයේ නියුතුව සිටි සේවකයන් දෙදෙනෙකු විසින් නොදන්වා සේවයට නොපැමිණීම හේතු කොටගෙන සේවයෙන් විශ්‍රාම ගැන්වීම යන කරුණු මත වන්දි මුදලක් සඳහන් නොකර, ආයතනයට එරෙහිව කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ නඩු දෙකක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 4.1 කාර්ය සාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් 3ක් සඳහා රු.270,000 ක් සහ වාර සඟරා මිලට ගැනීමට රු.100,000 ක් වෙන් කර තිබූ නමුත්, එම වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පුහුණු අංශය විසින් සංවර්ධන වැඩ සටහන් තුනක් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර ඒ සඳහා රු.100,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, ඉන් "Gem Carving" පුහුණු පාඨමාලාව සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ විෂයය සංවර්ධන කටයුතුවලට අදාළ කාර්ය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.900,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, ඉදිරිපත්කර තිබූ ප්‍රගති වාර්තාවට අනුව ප්‍රදර්ශන 04 ක් සඳහා රු.348,510 ක් වැය කර තිබුණ ද, කැඳවීම් ලිපි ලද ග්‍රාමීය මට්ටමේ ප්‍රදර්ශනයක් ඇතුළු ප්‍රදර්ශන 4 ක් වෙනුවෙන් ප්‍රතිපාදන ඉතිරිව තිබියදීත් ආයතනය ඒ සඳහා සහභාගි වී නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳව වීඩියෝ වැඩ සටහන සැකසීම සඳහා රු.900,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.29,230 ක් වැය කර නියමිත කාර්යයේ ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදු කර තිබුණි.

(ඉ) 2012 වර්ෂය තුළදී පවත්වන ලද පාඨමාලා හය අතුරින් නියමිත පරිදි පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 243 ක් වූ අතර, ඊට අදාල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 337 ක් විය. පසුගිය වසර හා සැසඳීමේදී නුවර හා බුත්තල මධ්‍යස්ථාන 02 ක ස්වර්ණාභරණ නිෂ්පාදනය, මෝස්තර නිර්මාණය, මැණික් කැපීම හා ඔප දැමීම පාඨමාලා සඳහා සහභාගීත්වයේ අඩුවීමක් සිදුවී තිබුණි.

(ඊ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වලවේ ගඟ සහ කළු ගඟ ආශ්‍රිත ප්‍රදේශවල රත්‍රං නිධි පිහිටීම පිළිබඳව පර්යේෂණ කිරීමට රු.900,000 ක් හා පරිසර හිතකාමී ලෙස මැණික් පතල් කැනීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.450,000 ක් වශයෙන් එකතුව රු.1,350,000 වෙන්කර තිබුණි. එයින් රු.58,650 ක් වැය කර තිබුණු අතර 2012 මාර්තු මස වන විට එම ව්‍යාපෘතිය අතරමඟ නවතා නැවත සැප්තැම්බර් මස සිට

ආරම්භ කිරීමට මාණ්ඩලික රැස්වීමේදී  අනුමැතිය ලැබී තිබුණි. විගණන දිනය වූ 2013 මැයි මස වන විටත් එම ව්‍යාපෘතිවල ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

(උ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව විවිධ වර්ගයේ ගෙවුඩ සාම්පල් 50 ක් රැස්කර ඒවායේ රසායනික සංයුතිය විශ්ලේෂණය කර  සාම්පල් 06 ක  තාපකරණ මට්ටම් හඳුනාගෙන අවසන් වාර්තාව  සකස් කිරීම අරමුණු කරගෙන රු.900,000 ක්  වෙන් කර තිබුණි. ඒ අනුව සාම්පල් 36 ක් රැස්කර සාම්පල් 02 ක තාපකරණ මට්ටම් හඳුනාගෙන තිබුණ අතර ඒ සඳහා රු.43,200 ක් වැය කර තිබුණත්  බලාපොරොත්තු වූ ඉලක්කය කරා ළඟා කරගෙන නොතිබුණි.

## 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

වාර්ෂික වාර්තාව සඳහා  අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2009 සහ 2010 වර්ෂ දෙක සඳහා රු.188,700 ක් වැය කර වාර්ෂික වාර්තා 2400 ක් මුද්‍රණය කර තිබූ අතර, එම වාර්තා 2013 අගෝස්තු මස වන විටත් බෙදා හැරීමකින් තොරව ආයතනයේ රඳවා ගෙන තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

පෞද්ගලික ආරක්ෂක සේවයක්  මඟින් ආරක්ෂක සේවා ලබා ගැනීම සිදු කරන අතර, එම ආයතනය සමඟ 2005 ඔක්තෝබර් 04 දින එළඹ තිබුණු ගිවිසුම 2013 පෙබරවාරි මස වන විටත් අළුත් කිරීමට පියවර ගෙන නොතිබුණි. ගිවිසුමට අනුව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීමට එකඟතාවයකට එළඹ තිබුණද, ගෙවීම් කිරීමේ දී ගිවිසුමින් පරිබාහිරව විශේෂ ජ්‍යෙෂ්ඨ  ආරක්ෂක නියාමක තනතුර සහිත නිලධාරියෙකුට මසකට රු.18,500 බැගින් රු.222,000 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි.

## 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතියේ විශේෂඥ  උපදේශක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත  පූර්ණ කාලීනව පුද්ගලයෙකු පත් කර තිබුණි. එකී පත්වීම් ලිපියේ අංක 03 ඡේදය ප්‍රකාරව සේවා ස්ථානය රත්නපුර වන අතර, සේවා  ස්ථානය අවස්ථාවෝචිත පරිදි වෙනස් වීමට යටත්වන  බව සඳහන් කර තිබුණි. 2013 ජූනි මස විගණන පරීක්ෂණ අවස්ථාව වනවිට අදාල උපදේශකවරයා  සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ආයතනය සතුව නොතිබුණි. කෙසේ වුවද, ආයතනයේ ධාවන සටහන් පරීක්ෂාවේදී 2012 වර්ෂය තුළ දින 9 ක්  පමණක් ඔහු ව්‍යාපෘතියේ කටයුතු වල සම්බන්ධ වී

තිබූ බව තහවුරු විය. තවද ඔහුගේ පත්වීම් ලිපියේ අංක 05 ඡේදය ප්‍රකාරව මසකට රු.85,000 ක උපදේශක දීමනාවක් ගෙවන බවත්, රාජකාරි සඳහා නිවසේ සිට ප්‍රවාහන පහසුකම් සපයන බවත්, සඳහන් කර තිබූ අතර, 2012 වර්ෂය තුළ (සැප්තැම්බර් මාසය හැර) රු.849,750 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද ඔහු මොරටුව විශ්ව විද්‍යාලයේ ස්ථිර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු බව අනාවරණය විය. ඒ අනුව ඔහු රජයේ ආයතන දෙකක පූර්ණ කාලීනව සේවය කිරීම සහ ඔහුට ගෙවීම් කරන ලද දීමනාව මඟින් ආයතනයට ප්‍රතිලාභයක් ලැබී තිබුණේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

**4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවයින තුළ පිහිටුවන ලද පුහුණු මධ්‍යස්ථාන 06 ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යමින් තිබූ අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල ආරම්භ කරන ලද පුහුණු මධ්‍යස්ථාන 13 ක් ප්‍රතිපාදන නොලැබීම මත 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ වසා දමා තිබුණි.

(ආ) 2007 වර්ෂයේ දී රු.12,309,013 ක පිරිවැයක් දරා භූ විදුම් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එය අළුත්වැඩියා කිරීම සහ සේවා කිරීම සඳහා රු.67,676 ක් වියදම් කර තිබුණි. එසේම එම යන්ත්‍රය වෙනුවෙන් රක්ෂණ ආවරණ ලබා ගැනීම වෙනුවෙන් 2009 සිට 2012 වර්ෂය දක්වා එකතුව රු.410,115 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම යන්ත්‍රය උපයෝජනය කර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 07 දින කාර්යාලයීය අවශ්‍යතා සඳහා රු.25,500 ක් වැය කර ශබ්ද විකාශන කට්ටලයක් මිලට ගෙන තිබූ අතර, 2013 පෙබරවාරි 05 දින වන විටත් එය ප්‍රයෝජනයට නොගෙන ආයතනය තුළ නිෂ්කාර්යව රඳවා තිබුණි.

**4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති**

<u>**මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ අඩුපාඩු**</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂ හතරක කාල පරිච්ඡේදයක් තුළ ක්‍රියාත්මක කිරීම පිණිස මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී තිබූ නමුත්, නියමිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අපොහොසත් වී තිබුණි. අදාල කාර්යය සඳහා සළසා දීමට යෝජිත වූ රු. මිලියන 36 ක ප්‍රතිපාදනයෙන් වර්ෂයකට රු. මිලියන 9

බැහින් ලබා දීම සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව, 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා උක්ත ව්‍යාපෘතිය සඳහා රු.9,588,630 ක් වියදම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රු.3,517,442 ක් වූ අතර ජනවාරි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල ව්‍යාපෘතියට අදාලව කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු වී නොතිබුණි. ව්‍යාපෘති සමීක්ෂණ කටයුතු සඳහා රු.151,901 ක් එනම්, මුළු ව්‍යාපෘති වියදමෙන් සියයට 4.3 ක් වැනි අඩු ප්‍රමාණයක් සෘජුවම ව්‍යාපෘතියේ කටයුතු සඳහා වැය කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ අරමුණ වසර හතරක කාලය තුළ දිවයිනෙහි පළාත් 8 ක මැණික් නිධි ගවේෂණ කටයුතු සිදුකිරීම වුවද, 2012 දෙසැම්බර් 31 දින වන විට ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ පමණක් සමීක්ෂණ කටයුතු සිදු කරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 26.63 ක් පමණක් වැය කර තිබුණි.

## 4.7 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 මාර්තු 06 දින රු.5,925,000 කට මිලදී ගෙන තිබූ කැබ් රථය 2010 සැප්තැම්බර් 24 දින සිට 2012 නොවැම්බර් 28 දින දක්වා අළුත්වැඩියාව සඳහා අදාල නියෝජිත ආයතනය සහ වෙනත් ගරාජ් වෙත යොමු කර ඒ වෙනුවෙන් එකතුව රු.1,077,058 ක් වියදම් කර තිබුණි. ඉන් අවස්ථා 05 ක දී වැය කරන ලද එකතුව රු.355,739 ක් සඳහා කාර්මික නිලධාරි නිර්දේශය ලබා ගෙන නොතිබුණි.

(ආ) උක්ත වාහනයේ අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඉහල යෑම හේතුවෙන් 2011 අගෝස්තු 30 දින පැවැති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණය අනුව අමාත්‍යාංශ තාක්ෂණ නිලධාරිගේ නිර්දේශය පරිදි වාහනය වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණත්, එසේ නොකර එදිනෙන් පසුව ද අළුත් වැඩියාව සඳහා රු.721,323 ක් වැය කර තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 133 හා සන්සන්දනය කර බැලීමේ දී පුරප්පාඩු සංඛ්‍යාව 83 ක් වී තිබුණු අතර මාණ්ඩලික, මාණ්ඩලික නොවන සහ සුළු සේවක තනතුරුවල පිළිවෙලින් සියයට 69 ක, සියයට 64 ක හා සියයට 50 ක සේවක පුරප්පාඩු පැවතුණි.

## 5 ගිණුම්කරණ කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------------

### 5 .1 සංයුක්ත සැලැස්ම 2012-2016

-------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව අවම වශයෙන් මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලින කළ පිටපත් අදාල ආයතන වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, සංයුක්ත සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වී මාස 06 කට පසුව අනුමත කර අදාල ආයතනවලට යවා තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

2011 ජුනි 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ/2/33/7/213/3 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2012 ඔක්තෝබර් 01 දින එකී බඳවා ගැනීම් සිදුකර තිබුණත් අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 34 සිට සියයට 100 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.4 වාර්ෂික වාර්තා

-------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 4.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී මාස 10 ක් ඉක්මවීමට ප්‍රථම වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2009, 2010 සහ 2011 යන වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා 2013 ජුනි 27 දින වන විටත් සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.5 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

-----------------------------------------------

2011 අප්‍රේල් 08 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගනු ලැබූ තීරණ පිළිබඳව 2011 අංක 119 දරන පාර්ලිමේන්තු ප්‍රකාශනය මඟින් දැනුම් දී තිබූ නමුත්, ආයතනයේ අවිධිමත් වැටුප් වැඩි වීම සම්බන්ධව නිලධාරින්ට වැඩිපුර ගෙවූ වැටුප් අයකර ගැනීම හෝ පැවති වැටුප් තලයේ නැවත පිහිටුවීම් සිදුකර නොතිබුණි.

6. **පද්ධති හා පාලනය**

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ ආයතනයේ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ආ) ගිණුම්කරණය

(ඉ) වත්කම් පාලනය

(ඊ) අයවැය පාලනය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති


GJRTI
Gem and Jewellery Research and Training Institute
Bingiriya Training Center









